# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2025

**11 ශ්‍රේණිය** | **පුරවැසි අධ්‍යාපනය**

නම/ විභාග අංකයඃ ......................................... කාලය : පැය 3 යි

සැළකිය යුතුයි

i. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
ii. අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති **(1),(2),(3),(4)** පිළිතුරු වලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැළකිල්ලෙන් කියවා , ඒවා ද පිළිපදින්න.

1) අතීතයේ දී ඍජු ප්‍රජාතාන්ත්‍රවාදී ලක්‍ෂණ පදනම් කරගෙන පාලන කටයුතු සිදු කළ රාජ්‍ය වන්නේ,

1) බ්‍රිතාන්‍යය  2) ඇතැන්ස්
3) ඉන්දියාව  4) ඇමරිකාව

2) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියෙකු විසින් සමාජය වෙත ඉටුකළ යුතු යුතුකම් වර්ග දෙක වන්නේ,

1) සිවිල් හා දේශපාලන යුතුකම්  2) සංස්කෘතික හා ආගමික යුතුකම්
3) ආර්ථික හා සමාජීය යුතුකම්  4) නීතිමය හා සදාචාරාත්මක යුතුකම්

3) මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරාදීම යනු,

1) බලය විමධ්‍යගත කිරීමයි.  2) බලය බෙදීමයි.
3) බලය පවරා දීමයි.  4) බලය නියාමනය කිරීමයි.

4) පුද්ගලයා තුළ,පුද්ගලයන් අතර,පවුල තුළ,පවුල් අතර ඇතිවන ගැටුම් හඳුන්වන්නේ,

1) සාර්ව ගැටුම් ලෙසය.  2) පවුල් ගැටුම් ලෙසය.
3) සූක්ෂම ගැටුම් ලෙසය.  4) පුද්ගල ගැටුම් ලෙසය.

5) ආර්ථික නොවන භාණ්ඩයක් හා ආර්ථික භාණ්ඩයක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක් ද?

1) ජලය හා ආහාර  2) ජලය හා වාතය
3) ඖෂධ හා හිරු එළිය  4) ඇඳුම් හා ආහාර

6) මිනීමැරුම් හා සම්බන්ධ නඩු විභාග කිරීමේ බලය ඇති අධිකරණය වන්නේ,

1) අභියාචනාධිකරණය යි.  2) මහාධිකරණය යි.
3) ශ්‍රේෂ්ඨාධිකරණය යි.  4) මහේස්ත්‍රාත් උසාවිය යි.

7) මිනිසාට තම සමාජ ජීවිතය පරිපූර්ණ කර ගැනීම සඳහා සමාජයෙන් ලැබෙන හිමිකම් හඳුන්වන්නේ,

1) අයිතිවාසිකම් නමිනි.  2) නිදහස නමිනි.
3) සමානාත්මතාව නමිනි.  4) යුතුකම් නමිනි.

8) රටක සියල්ලටම ඉහළින් නීතිය පැවතීම හඳුන්වන්නේ,

1) නීතියේ ආධිපත්‍යය ලෙසය.  2) නීති විවරණය ලෙසය.
3) නීති මූලාශ්‍ර ලෙසය.  4) නීතියේ ගරුත්වය ලෙසය.

9) තල දෙකක ආණ්ඩු ක්‍රියාත්මක වන පාලන ක්‍රම සහිත රාජ්‍යයන්,

1) ඒකීය රාජ්‍ය වේ. 2) සන්ධීය රාජ්‍ය වේ.
3) සහ සන්ධීය රාජ්‍ය වේ. 4) අර්ධ සන්ධීය රාජ්‍ය වේ.

10) බලය හසුරුවන අය තමන්ට කැමති ආකාරයට බලයට යටත්වන අය පාලනය කිරීමට ඇති හැකියාව සහ තම කැමැත්තට අවනත නොවන විට බල කිරීම මඟින් අවනතභාවය ලබා ගැනීමේ හැකියාව බලය බව විස්තර කර ඇත්තේ,

1) ආර්ථික විද්‍යාත්මකවය 2) සමාජ විද්‍යාත්මකවය
3) දේශපාලන විද්‍යාත්මකවය 4) ශුද්ධ විද්‍යාත්මකවය

11) මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදු කරන නියෝජිතයා වන්නේ,

1) මහ ඇමතිවරයා ය. 2) පළාත් ලේකම්වරයා ය.
3) ජනාධිපතිවරයා ය. 4) ආණ්ඩුකාරවරයා ය.

12) ශ්‍රී ලංකාවේ පළාත්සභා ක්‍රමය ඇතිකළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වන්නේ,

1) 17 සංශෝධනය යි. 2) 13 සංශෝධනය යි.
3)19 සංශෝධනය යි. 2) 20 සංශෝධනය යි.

13) නිශ්පාදන සාධක හා ඒවාට කරන ගෙවීම් නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

i. භූමිය - වැටුප, ශ්‍රමය - බදුකුලිය, ප්‍රාග්ධනය - ලාභය, ව්‍යවසායකත්වය - පොලිය
ii. භූමිය - බදුකුලිය, ප්‍රාග්ධනය - පොලිය, ශ්‍රමය - වැටුප, ව්‍යවසායකත්වය - ලාභය
iii. භූමිය - ලාභය, ප්‍රාග්ධනය - බදුකුලිය , ශ්‍රමය - පොලිය, ව්‍යවසායකත්වය - වැටුප
iv. භූමිය - පොලිය , ප්‍රාග්ධනය - වැටුප , ශ්‍රමය - ලාභය, ව්‍යවසායකත්වය - බදුකුලිය

14) අන්තර් භාණ්ඩයක් දැක්වෙන පිළිතුර වන්නේ,

1) ආහාර 2) වාහන
3) ගොඩනැගිලි 4) පොහොර

15) මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමෙහිලා මධ්‍ය සැලසුම් මණ්ඩලයක් මඟින් ක්‍රියා කරන දේපළ,පොදු අයිතිය යටතේ පවතින ආර්ථික සංවිධාන ක්‍රමය,

1) ධනවාදි ආර්ථික ක්‍රමය යි. 2) සමාජවාදි ආර්ථික ක්‍රමය යි.
3) මිශ්‍ර ආර්ථික ක්‍රමය යි. 4) පරිවර්තන ආර්ථික ක්‍රමය යි.

16) විද්‍යාව හා තාක්‍ෂණය පදනම් කරගෙන ලෝකයේ සෑම අංශයක්ම එකට සම්බන්ධ වීම හඳුන්වන්නේ,

1) ගෝලීයකරණය නමිනි 2)විදේශ සබඳතා නමිනි
3) රාජ්‍ය සබඳතා නමිනි 2) තාක්ෂණීකරණය නමිනි

17) බහු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල් එකතු වී පිහිටුවාගත් සංවිධානය වන්නේ,

1) යුරෝපා සංගමය 2) නෆ්තා ගිවිසුම
3) බිම්ස්ටෙක් සංවිධානය 4) සාර්ක් සංවිධානය

18) ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතිය ඉදිරිපත් කළේ,

1) ජෝර්ජ් සිමෙල් ය 2) ජොන්ස් රොල්ස් ය
3) ජොහාන් ගැල්ටුන් ය 4) එඩ්වන් බාන්ස් ය

19) නිකාය භේදය නිසා ඇතිවූ යුද්ධයකට උදාහරණයක් වන්නේ,

1) ඊශ්‍රාල - පලස්තීන ගැටුම 2) දකුණු අප්‍රිකාවේ වර්ණභේද ගැටුම
3) සෝමාලියා - ඉතියෝපියා ගැටුම 4) අයර්ලන්ත යුද්ධය

20) පුද්ගල ගැටුම් මෙන්ම දෙපාර්ශවයක් අතර පවතින ගැටුම්වලදී තෙවන පාර්ශවයක් විසින් විවිධාකාරයෙන් පහසුකම් සපයා උපදෙස් හා මඟපෙන්වීම් ලබා දෙමින් ගැටුම් නිරාකරණයට යොමුවීම,

1) විනිසීම යි. 2) එකඟත්වයක් ගොඩනැගීම යි.
3) උපදේශනය යි. i. බේරුම් කිරීම යි.

21) ලන්දේසි යුගයේදී මෙරට ක්‍රියාත්මක වූ අධිකරණ දිස්ත්‍රික්ක ගණන,

1) 3 කි 2) 5 කි
3) 4 කි 4) 7 කි

22) ශ්‍රී ලංකාවේ අවසාන හා ඉහළම අභියාචන අධිකරණ බලය සහිත උපරිමාධිකරණය වන්නේ,

1) අභියාචනාධිකරණය යි. 2) ශ්‍රේෂ්ඨාධිකරණය යි.
3) දිසා අධිකරණය යි 4) පළාත්බද මහාධිකරණය යි.

23) ශ්‍රී ලංකාවට සර්වජන ඡන්ද බලය හඳුන්වා ආණ්ඩුක්‍රම ප්‍රත්සංස්කරනය වන්නේ,

1) කෲව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයයි 2) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයයි
3) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයයි 4) මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයයි

24) ශ්‍රී ලංකාවේ වර්තමාන පරිපාලන දිස්ත්‍රික්ක ගණන වන්නේ,

1) 22 කි 2) 25 කි
3) 9 කි 4) 24 කි

25) 1978 ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුවට මහජන ඡන්දයෙන් තේරීපත් වන මන්ත්‍රී සංඛ්‍යාව,

1) 196 කි 2) 225 කි
3) 29 කි 4) 240 කි

26) මහනගර සභාවක ප්‍රධානියා වන්නේ,

1) නගරාධිපති ය 2) සභාපති ය
3) උපසභාපති ය 4) ලේකම් ය

27) පළාත් පාලන ආයතනවල පොදු උපයෝගිතා සේවාවට අදාළ කාර්යයක් වන්නේ,

1) මංමාවත් ආරක්ෂා කිරීම 2) පොදු කානු ඉදිකිරීම
3) පොදු කියවීම් ශාලා පවත්වාගෙන යාම 4* අතුරු පාරවල් ඉදිකිරීම

28) මිනිසුන්ට අත්‍යවශ්‍යයෙන්ම තිබිය යුතු යැයි සැළකෙන මානව හිමිකම් අතුරින් තෝරාගත් ප්‍රධාන අයිතිවාසිකම් බොහෝ රටවල් තම මූලික නීතියට ඇතුළත් කර ඇත. ඒවා හඳුන්වන්නේ,

1) මානව අයිතිවාසිකම් නමිනි 2) අයිතිවාසිකම් නමිනි
3) මූලික අයිතිවාසිකම් නමිනි 4) මානව හිමිකම් නමිනි

29) එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ වගන්ති ගණන,

1) 25 කි 2) 30 කි
3) 45 කි 4) 120 කි

30) සිවිල් හා දේශපාලන අයිතිවාසිකමක් වන්නේ,

1) ගමනාගමනයට ඇති නිදහසයි 2) පෞද්ගලික දේපළ දැරීමට ඇති අයිතිය
3) අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය 4) සමාජ ආරක්ෂණයට ඇති අයිතියයි

31) මරණ දඬුවම අහෝසි කිරීමේ අරමුණ ඇතිව පිහිටුවා ගත් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ දෙවන වෛකල්පිත ගිවිසුම සම්මත කරගත් වර්ෂය වන්නේ,

1) 1966 2) 1989
3) 1945 4) 1980

32) අන්තර්ජාතික මානව අයිතිවාසිකම් පනතට අයත් ප්‍රධාන නීතිමය ලේඛන ගණන,

1) 6 කි 2) 14 කි
3) 3 කි 4) 7 කි

33) කාන්තාවන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස්කම් තුරන් කිරීමේ සම්මුතිය හඳුන්වන්නේ,

1) සිඩෝ සම්මුතිය ලෙසය 2) සප්තා ගිවිසුම ලෙසය
3) කොළඹ ගිවිසුම ලෙසය 4) ජිනීවා සම්මුතිය ලෙසය

34) ළමා අයිතිවාසිකම් සම්මුතියට අනුව ළමයෙක් ලෙස සළකන්නේ,

i. අවුරුදු 16 ට අඩු පුද්ගලයන්ය ii. අවුරුදු 14 ට අඩු පුද්ගලයන්ය
iii. අවුරුදු 18 ට අඩු පුද්ගලයන්ය iv. අවුරුදු 11 ට අඩු පුද්ගලයන්ය

35) ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම සඳහා පිහිටුවා ඇති සෘජු දුරකතන අංකය වන්නේ,

1) 1919 2) 1918
3) 119 4) 1929

36) ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකු ලෙස සලකන කඩයිම් වයස වන්නේ,

1) අවුරුදු 50 - 55
2) අවුරුදු 55 - 60
3) අවුරුදු 55 - 65
4) අවුරුදු 50 - 60

37) වැඩකරන ජනතාවට සමාජ සාධාරණත්වය ඉටුකිරීම වෙනුවෙන් බිහි වූ අන්තර්ජාතික සංවිධානය,

1) අන්තර්ජාතික කම්කරු සංවිධානය
2) යුනිසෙෆ් සංවිධානය
3) යුනෙස්කෝ සංවිධානය
4) ලෝක බැංකුවයි

38) පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ප්‍රධාන නීතිය වන්නේ,

1) ජාතික පරිසර පනත
2) මධ්‍යම පරිසර අධිකාරිය
3) පරිසර අමාත්‍යාංශය
4) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

39) පරිපාලන ක්‍රියාවකින් සිදුවන මූලික අයිතිවාසිකමක් පිළිබඳ පැමිණිලි කළ හැකි වන්නේ,

1) ඔම්බුඩ්ස්මන්වරයාටය
2) නීතිපතිවරයාටය
3) අධිකරණ ඇමතිටය
4) අග විනිසුරුවරයාටය

40) ''කෙනෙකුට සැරයටියක් වනමින් පාරේ ගමන් කළ හැකි වුවත් එම නිදහස අනෙකාගේ නාසය ළඟින් කෙළවර විය යුතුය.'' අයිතිවාසිකම් වල සීමාව අඟවන මෙම ප්‍රකාශය ඉදිරිපත් කළ දාර්ශනිකයා වන්නේ,

1) ඒබ්‍රහම් ලින්කන් ය
2) හැරල්ඩ් ලැස්කි ය
3) සීලර් ය
4) ස්ට්‍රෝන්ග් ය

(ලකුණු 40× 1 =40)

## II කොටස

- **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1)

i. ලෝකයේ අතීතයේ පටන් විවිධ රාජ්‍යයන් පාලනය කිරීම සඳහා භාවිතා කළ පාලන ක්‍රම **02 ක්** දක්වන්න.
ii. පක්ෂ ක්‍රමයේ ස්වරූප **02 ක්** නම් කරන්න.
iii. රාජ්‍යයක දක්නට ලැබෙන මූලික ලක්ෂණ **02 ක්** ලියන්න.
iv. ආණ්ඩුවේ ආයතන **02 ක්** දක්වන්න.
v. සන්ධීය ආණ්ඩුක්‍රම පවතින රටවල් **02 ක්** දක්වන්න.
vi. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පළාත් පාලන ආයතන **02 ක්** දක්වන්න.
vii. සංස්කෘතියට අයත් ලක්ෂණ **02 ක්** දක්වන්න.
viii. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග **02 ක්** දක්වන්න.
ix. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වලට පැවරී ඇති කාර්යයන් ප්‍රධාන තේමා **දෙකක්** දක්වන්න.
x. ශ්‍රී ලංකාවේ පළාත් **02 ක්** නම් කරන්න.

(ලකුණු 2× 10 =20)

2)

i. නීතියේ ගුණාංග **02 ක්** දක්වන්න. (ල. 2)
ii. නීති මූලාශ්‍ර **03 ක්** දක්වන්න. (ල. 3)
iii. (a) දේශීය නීතියේ ප්‍රභේද **02ක්** දක්වන්න. (ල. 2)
(b) අප්‍රමාදව හා අපක්ෂපාතීව යුක්තිය පසඳලීම සිදු නොවීම නිසා ඇතිවිය හැකි අවාසිදායක තත්ව **02ක්** දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල. 3)

3)

i. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ ප්‍රධාන ස්වරූප **02ක්** දක්වන්න. (ල. 2)
ii. ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලු **03ක්** දක්වන්න. (ල. 3)
iii. (a) ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතු **02ක්** දක්වන්න. (ල. 2)
(b) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට අවශ්‍ය සාධක **02ක්** දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල. 3)

සාධක 02- ලකුණු 2
විස්තරය - ලකුණු 1

4)

i. ශ්‍රී ලංකාවේ පවතින ආගම් **02ක්** දක්වන්න. (ල. 2)
ii. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපෑ ඇති සාධක **03ක්** නම් කරන්න. (ල. 3)
iii. (a) රටක සමාජ සාධාරණත්වය බිඳවැටීමට බලපාන සාධක **02ක්** දක්වන්න. (ල. 2)
(b) බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් ලැබෙන වාසි **02ක්** දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල. 3)

5)

i. මූලික ආර්ථික ප්‍රශ්න **02ක්** දක්වන්න. (ල. 2)
ii. නිෂ්පාදනය සඳහා යොදාගන්නා ශිල්පීය ක්‍රම 02 දක්වන්න. (ල. 2)
iii. (a) ආර්ථිකයක සිදුවන ක්‍රියාවලි **02ක්** දක්වන්න. (ල. 2)
(b) ගෝලීයකරණයේ ඍණාත්මක බලපෑම් **02ක්** දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල. 3)

6)

i. ළමා අයිකිවාසිකම් උල්ලංඝනය වන අවස්ථා **02ක්** දක්වන්න. (ල. 2)
ii. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම විශේෂ අරමුණු හතරක් යටතේ සිදුවේ.ඉන් **03ක්** නම් කරන්න.(ල. 3)
iii. (a) පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ආයතන **02ක්** දක්වන්න. (ල. 2)
(b) පාසල් සාමාජිකයෙකු ලෙස ඔබ සතු විය යුතු **යුතුකම් දෙකක්** දක්වා ඉන් **එකක්** විස්තර කරන්න. (ල. 3)

7)

i. මනසේ සාමය ඇතිකර ගැනීම සඳහා යොමුවිය හැකි ආකාර **02ක්** දක්වන්න. (ල. 2)
ii. ගැටුම් ඇතිවන මූල **03ක්** දක්වන්න. (ල. 3)
iii. (a) සාකච්ඡා ක්‍රමය යොදාගත හැකි අවස්ථා **02ක්** දක්වන්න. (ල. 2)
(b)ගැටුම් සාමකාමී ව නිරාකරණය කර ගැනීමේ **වාසි දෙකක්** දක්වා ඉන් **එකක්** විස්තර කරන්න. (ල. 3)